# 2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

**කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

**(ධීවර අංශය)**

**මාළිගාවත්ත, කොළඹ -10**

**වැය ශීර්ෂ අංකය : 118**

| අන්තර්ගතය | පිටු අංකය |
|---|---|
| **01. ආයතනික පැතිකඩ** | |
| 1.1. හැඳින්වීම | 03 |
| 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු | 04 |
| 1.3. ප්‍රධාන කාර්යයන් | 04 |
| 1.4. සංවිධාන සටහන | 05 |
| 1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ආයතන | 06 |
| 1.6. අමාත්‍යාංශය යටතේ පවතින ආයතනගත අරමුදල් | 07 |
| 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු | 08 |
| **02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම** | 09 - 11 |
| **03. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය** | |
| 3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 12 - 13 |
| 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 14 |
| 3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | 15 - 16 |
| 3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් | 17 |
| 3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය | 18 |
| 3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය | 18 |
| 3.7. මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 18 |
| 3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය | 19 |
| 3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව | 20 - 22 |
| **04. කාර්ය සාධන දර්ශක** | |
| 4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක(ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) | 23 |
| **05. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය** | |
| 5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු | 24 |
| 5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් | 24 - 27 |
| **06. මානව සම්පත් පැතිකඩ** | |
| 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය | 28 |
| 6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය | 28 |
| 6.3. මානව සම්පත් සංවර්ධනය | 29 |
| **07. අනුකූලතා වාර්තාව** | 30 - 36 |

## 01 ආයතනික පැතිකඩ

### 1,1. හැඳින්වීම

ප්‍රධාන වශයෙන් මත්ස්‍ය සම්පතින් ගහණ වර්ග කි.මී. 517,000 ක සාගර සම්පතින් හා සංවර්ධනය කල හැකි කළපු, මෝය හා වැව් වලින් යුත් හෙක්ටයාර් 489,000 ක ජලාශ පද්ධතියකින් සමන්විත ශ්‍රී ලංකාවේ ධීවර අංශය, එහි මානව සම්පත අතීතයේ සිට ධීවර හා ජලජ සම්පත් නෙලා ගැනීම ජීවනෝපාය කරගත් ධීවර ප්‍රජාව හා ඒ හා සම්බන්ධ වක්‍ර සේවා නියුක්තිකයන්ගෙන් යුක්තවේ. මානව සම්පත් හා ස්වාභාවික සම්පත් වලින් අනූන ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය ඉහළ තලයකට රැගෙන ඒම පිණිස රජය විසින් විශාල පිරිවැයක් දරා යටිතල පහසුකම් රැසක් ඉදිකර තිබීම වැදගත් කොට සැළකිය යුතුය.

2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ධීවර අංශයේ ප්‍රධාන ආයතනය වන්නේ කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ධීවර අංශය වන බැවින්, 2019 වසරේ සිට ශ්‍රී ලංකාවේ ධීවර සම්පත තිරසාර ලෙස භාවිතා කිරීම සඳහා ප්‍රතිපත්ති,ක්‍රමෝපාය හා සැලසුම් සම්පාදනය සඳහා අමාත්‍යාංශයේ ධීවර අංශය ඍජුවම සම්බන්ධ වී ඇත.

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරි මාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ධීවර අංශයේ විෂය පථය යටතේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, ලංකා ධීවර සංස්ථාව හා සී/ස සීනෝර් පදනම යන ආයතන ක්‍රියාත්මක වන අතර එම ආයතන වල සහයෝගය තුලින් අපේක්ෂිත ඉහළ සංවර්ධන මට්ටමක් කරා ළඟා වීමට ඉවහල් වන ශක්තීන් හා අවකාශයන් හඳුනාගනිමින්, ඒ මත සැලසුම් හා ක්‍රමෝපායන් සම්පාදනය කොට ඇත. ඒ අනුව අමාත්‍යාංශය විසින් 2018 – 2020 මධ්‍යකාලීන සැලසුම්වල දක්වා ඇති අපේක්ෂිත ඉලක්ක සාධනය සඳහා ඉහත ආයතන විසින් මානව හා භෞතික සම්පත් මෙහෙයවීමට කටයුතු සිදු කරන ලදී.

## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

ධීවර හා ජලජ සම්පත් සංරක්ෂණය සහ තිරසාර භාවිතය පිළිබඳ දකුණු ආසියානු කලාපයේ ප්‍රමුඛයා වීම.

**මෙහෙවර**

වර්තමාන හා අනාගත පරපුරේ යහපත උදෙසා ධීවර හා ජලජ සම්පත් භාවිතය කළමනාකරණය කිරීම.


**ප්‍රතිපත්තිමය අරමුණු**

- ජාතික මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම තුළින් ජනතාවගේ පෝෂණ තත්වය හා ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම
- පසු අස්වනු නාස්තිය අවම කිරීම හා මත්ස්‍ය සැපයුමේ ගුණාත්මක භාවය සම්මත ප්‍රමිතින් කරා ඉහළ නංවාලීම
- ධීවර කර්මාන්තය හා ආශ්‍රිත කර්මාන්ත මඟින් රැකියා උත්පාදනය වැඩි කිරීම හා ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්වය නංවාලීම
- සාම්ප්‍රදායික නොවන ධීවර නිෂ්පාදන අපනයනයෙන් විදේශ විනිමය ඉපයීම වැඩි කිරීම
- ධීවර සම්පත් වල ජීව විද්‍යාත්මක තිරසාරත්වය තහවුරු කිරීම සඳහා ධීවර හා ජලජ සම්පත් සංරක්ෂණය හා කළමනාකරණය කිරීම

## 1.3. ප්‍රධාන කාර්යයන්

- පාරිභෝගික අවශ්‍යතා තෘප්තිමත් කරමින් මත්ස්‍ය නිෂ්පාදන දරාගත හැකි මිලකට සැපයීම
- සාගර, කිවුල් දිය හා අභ්‍යන්තර ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම
- ප්‍රතිපත්ති හා වැඩසටහන් විධිමත්ව සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- ජාතික ජලජ සම්පත් තිරසාර ලෙස උපයෝගී කර ගනිමින් සංවර්ධනය කිරීම.
- නිෂ්පාන අන්තර්ජාතික තත්ත්වයට උසස් වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා පහසුකම් සැලසීම

## 1.4 MINISTRY OF FISHERY AND AQUATIC RESOURCES – ORGANIZATIONAL CHART




❖ Those officers are attached to the Department of Census & Statistics.

## 1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ආයතන

| | |
|---|---|
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (DFAR) | **අපේක්ෂිත අරමුණු-**ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය, සංවර්ධනය හා සංරක්ෂණය<br><br>**වගකීම්** - කලාපීය හා අන්තර්ජාතික සම්මුතීන්ට හා රෙගුලාසි වලට අනුකූලව 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත හඳුන්වාදීම සහ ධීවර කළමනාකරණ කටයුතු හා නෛතික විධිවිධාන යාවත්කාලීන කිරීම. |
| ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA) | **අපේක්ෂිත අරමුණු** - ජලජ සම්පත් පිළිබඳ පර්යේෂණ, ජලජ සම්පත් සංවර්ධනය, සංරක්ෂණය හා කළමනාකරණය.<br><br>**වගකීම්** - 1981 අංක 54 දරණ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනත යටතේ ස්ථාපිත මෙම ආයතනය මගින් ජලජ සම්පත් හා ජලජීවී වගාව, ධීවර තාක්ෂණය, මත්ස්‍ය හා පසු අස්වනු තාක්ෂණය, පාරිසරික අධ්‍යයනය, සමුද්‍ර ජීව විද්‍යාව,ජල ශාස්ත්‍රය හා සාගර අධ්‍යයන කටයුතු සිදුකිරීම. |
| ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය **(NAQDA)** | **අපේක්ෂිත අරමුණු** - වගා කිරීම මත පදනම් වූ මිරිදිය ධීවර කර්මාන්තය හා ජලජීවී වගාව සංවර්ධනය සහ කළමනාකරණය.<br><br>**වගකීම්** - 1998 අංක 53 දරණ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරී පනත යටතේ ස්ථාපිත කරන ලද මෙම ආයතනය මගින් මිරිදිය ධීවර කර්මාන්තය සහ ජලජීවී වගාවට අවශ්‍ය බීජ සැපයීම හා ව්‍යාප්ති සේවය ලබාදීම ඉස්සන් වගා කටයුතු අධීක්ෂණය, ජලජීවී වගා පුහුණු කටයුතු සැපයීම. |
| ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව **(CFHC)** | **අපේක්ෂිත අරමුණු - ධීවර වරායන්, නැංගුරම්පොළවල් සැලසුම් කිරීම, ඉදිකිරීම හා පවත්වාගෙන යාම.**<br><br>**වගකීම්** - 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ මෙම ආයතනය මගින් වර්තමානයේ ධීවර වරායන් 20 ක් හා නැංගුරම්පොළවල් 58 ක් පවත්වාගෙන යාම. |
| ලංකා ධීවර සංස්ථාව **(CFC)** | **අපේක්ෂිත අරමුණු - මත්ස්‍ය නිෂ්පාදකයාට හා පාරිභෝගිකයාට උපරිම වාසි සැලසෙන අයුරින් මත්ස්‍ය වෙළඳපල සඳහා දායක වීම.**<br><br>**වගකීම්** - 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ ස්ථාපිත මෙම ආයතනය මගින් මාළු මිලදී ගැනීම හා විකිණීම, අයිස් නිපදවීම හා විකිණීම, ශීතාගාර පහසුකම් පවත්වාගෙන යාම හා මත්ස්‍ය අතුරු නිෂ්පාදන විකිණීම සිදුකෙරේ. |
| සීමාසහිත සීනෝර් පදනම | **අපේක්ෂිත අරමුණු - ධීවර කර්මාන්තයට අදාල වන්නාවූ යෙදවුම් හා සැපයුම් ලබාදීම.**<br><br>**වගකීම්** - 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති මෙම ආයතනය මගින් ෆයිබර් ග්ලාස් ආශ්‍රිත උපකරණ හා ඔරු,බෝට්ටු නිෂ්පාදනය කරන අතර අනිකුත් සියළුම ධීවර ආම්පන්න අලෙවිය සිදු කරනු ලබයි. |

## 1.6. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන අරමුදල්

| ආයතනය | වැඩසටහන | අයවැය ප්‍රතිපාදන රු.මිලියන |
|---|---|---|
| කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය (ධීවර අංශය) | නව තාක්ෂණය හඳුන්වා දීමට සහය දැක්වීම | 1,016.00 |
| | ධීවර ප්‍රජාව බලගැන්වීම | |
| | වෙරළ පුනුරුත්ථාපනය හා සම්පත් කළමනාකරණ වැඩසටහන | |
| | හම්බන්තොට, යාපනය හා මඩකලපුව ඇතුළු වෙරළබඩ දිස්ත්‍රික්ක 10 ක පවතින ධීවර ගම්මාන වැඩිදියුණු කිරීම | |
| | වැවක් සමග ගමක් වැඩසටහන යටතේ ඒකාබද්ධ අභ්‍යන්තර ධීවර ගම්මාන ස්ථාපිත කිරීම | |
| | කලපු 10 ක් පවිත්‍ර කිරීම (ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව) | |
| | අභ්‍යන්තර ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා මිරිදිය ජල මූලාශ්‍රවල මත්ස්‍ය ඇඟිලිලන් තැන්පත් කිරීම (ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය) | |
| | නව ධීවර හා ජලජීවී වගා ප්‍රතිපත්තියක් සම්පාදනය | |
| | ඔරුවැල්ල ධීවර ප්‍රජා ගුවන් විදුලි වැඩසටහන | |
| | | |
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | කුඩා හා මධ්‍ය ප්‍රමාණයේ ධීවර කර්මාන්තය සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම | 547.11 |
| | බහු දින යාත්‍රාවල මෙහෙයුම් කාර්යක්ෂමතාව නැංවීම සඳහා වන පිරිවැයෙන් 50% ක සහනාධාරය | |
| | 50% සහනාධාරය යටතේ අඩි 55 ට වැඩි බහු දින යාත්‍රා 05ක් නිෂ්පාදනය කිරීම | |
| | වෙනත් සංවර්ධන ප්‍රාග්ධනය (ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව) | |
| | | |
| ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය | ප්‍රාග්ධන සංවර්ධනය | 515.00 |
| | මත්ස්‍යන් ඇති දැඩි කිරීම වැඩි කිරීම | |
| | ජාතික ආහාර සුරක්ෂිතතා වැඩසටහන | |
| | ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරියේ මෙහෙයුම් පුළුල් කිරීම (NAQDA) (BP – 2016 / 2017) | |
| | | |
| | | |
| `ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය | ප්‍රාග්ධන සංවර්ධනය | 285.00 |
| | | |
| ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව | ප්‍රාග්ධන සංවර්ධනය | 225.00 |
| | | |
| ධීවර වරාය, නැංගුරම්පොළ හා තොටුපොළ සංවර්ධන ව්‍යාපෘතිය | ධීවර වරාය, නැංගුරම්පල හා තොටුපල සංවර්ධනය හා පුනරුත්ථාපනය | 1,560.0 |
| | හලාවත, මිරිස්ස, කල්මුණේ, වැල්වැටිතුරේ, කරෙයිනගර් හා පුරාණ වැල්ල ධීවර වරායන් සංවර්ධනය හා වැඩිදියුණු කිරීම | |
| | උතුරු පළාතේ තිරසර ධීවර සංවර්ධන වැඩසටහන (ආසියානු සංවර්න බැංකුව / ශ්‍රී ලංකා රජය) | |
| | ගන්දර ධීවර වරාය සංවර්ධනය හා වැල්ලමංකර නව ධීවර වරායන් සංවර්ධනය කිරීම | |
| | මයිලඩි වරාය ධීවර වරායක් ලෙස සංවර්ධනය කිරීම හා ශීතාගාර හා ගබඩා පහසුකම් වැඩිදියුණු කිරීම | |

## 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

| ව්‍යාපෘතියේ නම | දායක නියෝජිතායතනය | ව්‍යපෘතියේ ඇස්තමේන්තුගත වියදම රු.මි. | ව්‍යාපෘති කාල සීමාව |
|---|---|---|---|
| උතුරු පළාතේ තිරසාර ධීවර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා මූලික ව්‍යාපෘති සැලසුම් ව්‍යාපෘතිය | ආසියානු සංවර්ධන බැංකුව හා ශ්‍රී ලංකා රජය | 128.5 | අවු. 03 |
| උතුරු පළාතේ තිරසාර ධීවර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | ආසියානු සංවර්ධන බැංකුව හා ශ්‍රී ලංකා රජය | 35,877.727<br>(USD 201.22) | අවු. 05 |
| ජාතික ධීවර සහ ජලජීවී වගා ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමේ නෝර්වේජියානු තාක්ෂණික ආධාර ව්‍යාපෘතිය | නෝර්වේ රජය | 158.330<br>(NOK 8.3) | අවු. 03 |

** හුවමාරු වටිනාකම 2019.12.31 දිනට

1 USD = 178.301 LKR

1 NOK = 19.076 LKR

## 02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2019 වසර සඳහා රජය මගින් කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ධීවර අංශය සඳහා වෙන්කරන ලද සම්පූර්ණ අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි.4421.3 ක් වූ අතර ඉන් රු.මි. 3822.3 ක ප්‍රමාණයක් 2019 වර්ෂය තුල වැය කොට ඇත.

එසේම, 2019 ජනවාරි - දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළදී, මුළු මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 505,830 ක් වන අතර කරදිය හා මිරිදිය ධීවර කර්මාන්තය පිළිවෙලින් මෙට්‍රික් ටොන් 415,490 ක් සහ මෙට්‍රික් ටොන් 90,340 ක් ලෙස මත්ස්‍ය නිෂ්පාදනයට දායක වී ඇත.

මහජනයාගේ පෝෂණ මට්ටම් හා යහපත් සෞඛ්‍යය තත්ත්වය වර්ධනය කිරීම සඳහා ප්‍රෝටීන් මූලාශ්‍රයක් ලෙස මත්ස්‍ය පරිභෝජනය ඉතා වැදගත් වේ. 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ඒක පුද්ගල මත්ස්‍ය පර්භෝජනය දිනකට ග්‍රෑම් 46 ක් වුවද, එම ප්‍රමාණය ඉදිරි කාලය තුළ වැඩිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ජාතික ආදායමට ධීවර ක්ෂේත්‍රයේ වර්ධනීය දායකත්වය සැළකීමේදී, මත්ස්‍ය අපනයන දායකත්වය ප්‍රශංසාත්මක ලෙස ඉහළ මට්ටමක රැඳී ඇත. 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළදී, මුළු මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයන මෙට්‍රික් ටොන් 28,771 ක් ලෙස වර්ධනය වී ඇති අතර අපනයන වටිනාකම රු.මි. 53,483 ක් ලෙස වාර්තා වී ඇත. තවද, විසිතුරු මසුන් අපනයනය එකී කාලපරිච්ඡේදය තුළදී රු.මි.2913 ක ආදායමක් උපයා ඇත.

ධීවර ප්‍රජාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමේ අරමුණින් වර්ෂ 2018 දී ක්‍රියාත්මක කළ 'වැවක් සමඟ ගමක්' නිවාස හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන 2019 වර්ෂය තුලදී අඛණ්ඩව ක්‍රියාත්මක විය. ඒ යටතේ සියලුම දිස්ත්‍රික්ක වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, පවත්නා නිවාස අළුත්වැඩියා කිරීම, නව නිවාස ඉදි කිරීම හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සාර්ථකව සිදුකරන ලදී.

2019 වර්ෂයේ ප්‍රතිපාදන භාවිතා කර ධීවර ක්ෂේත්‍රය තුළ ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කර ඇත. මේ අතර ධීවර වරාය, නැංගුරම්පල හා තොටුපලවල් සංවර්ධනය කිරීම, අභ්‍යන්තර ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් අභ්‍යන්තර ජලාශවල තැන්පත් කිරීම, ධීවර කර්මාන්තයට නව තාක්ෂණය හඳුන්වාදීම, ධීවර ප්‍රජාව බලගැන්වීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, ධීවරයන් සඳහා නිවාස ඉදිකිරීම හා අලුත්වැඩියාව, ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්, වෙරළ පුනරුත්ථාපනය සහ සම්පත් කළමනාකරණය, මසුන් බෝ කිරීමේ මධ්‍යස්ථාන ඉදිකිරීම හා සංවර්ධනය, ධීවර ගම්මාන සංවර්ධනය කිරීම, ඒකාබද්ධ ධීවර ගම්මාන ස්ථාපිත කිරීම, කලපු 10 ක් පවිත්‍ර කිරීම, බහු දින ධීවර යාත්‍රා වල මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිකිරීම 2019 දී ක්‍රියාත්මක කළ ප්‍රමුඛතම ව්‍යාපෘතීන් වේ.

නීති විරෝධී, වාර්තා නොවන හෝ නියාමනය නොවන ධීවර කර්මාන්තය වැළැක්වීම සඳහා කළාපීය හා අන්තර්ජාතික වශයෙන් සකස් කරන ලද සම්මුතීන්ට අනුකූල වන පරිදි නීති විරෝධී ධීවර කටයුතු වලට එරෙහිව ජාතික මට්ටමේ රෙගුලාසි සංශෝධනය කිරීමට සහ නීති ප්‍රතිපාදන බල ගැන්වීමට පියවර ගෙන ඇත. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර පවත්නා අඛණ්ඩ ද්විපාර්ශික සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ ඉන්දීය ධීවරයන් විසින් සිදු කරනු ලබන නීති විරෝධී ධීවර ක්‍රියාකාරකම් අඩුකිරීමට හැකිවනු ඇත.

තවද, නෝර්වීජියානු තාක්ෂණික ආධාර මත සම්පාදිත ශ්‍රී ලංකාවේ ධීවර ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කොට ඇත. මේ තුලින් ඉදිරි ලෝක ආර්ථික ප්‍රවණතාවයන්ට මුහුණ දෙමින් ශ්‍රී ලංකාවට උචිත ස්ථාවර ප්‍රතිපත්තියක් මත ධීවර අංශයේ අනාගත තිරසාර සංවර්ධනයට මංපෙත් විවර වනු ඇත.

එසේම, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය සිය පර්යේෂණයන්ට අනුව මත්ස්‍ය පසු අස්වනු හානිය 40% - 60% වන බව පෙන්වා දෙමින්, එම තත්වය අවම කරගැනීමට උචිත ක්‍රමෝපායන් නිර්දේශ කොට ඇත. ධීවර ප්‍රජාවේ දැනුවත්භාවය වැඩිකිරීම, නවීන පහසුකම්වලින් සමන්විත වන පරිදි යාත්‍රා නිෂ්පාදනය හා නවීකරණය, ගුණාත්මක තත්ත්වයේ අයිස් හා ජලය භාවිතා කිරීම, විධිමත් ලෙස මත්ස්‍ය අස්වැන්න නෙලීම හා ගොඩබෑම, ශීතාගාර හා පවිත්‍ර ජල පහසුකම් වලින් සමන්විත ධීවර වරායන් පවත්වාගෙන යාම ආදී ක්‍රියාදාමයන් රාශියක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. තවද, අමාත්‍යාංශය යටතේ දැනට ක්‍රියාත්මක ධීවර වරාය, නැංගුරම්පොළ හා තොටුපොළ සංවර්ධන ව්‍යාපෘතිය ධීවර වරායන් නව තාක්‍ෂණයෙන් යුක්තව ප්‍රතිසංස්කරණය කිරීමේදී, මේ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කොට ඇත.

2019 නොවැම්බර් මස පත්වූ නව ජනාධිපතිතුමා විසින් ධීවර හා ජලජ සම්පත් සඳහාම වෙන්වූ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයක් ස්ථාපිත කොට ඇත.

මෙම අමාත්‍යාංශය තුලින් ගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" මැතිවරණ ප්‍රකාශනයේ ධීවර අංශයට අදාළ පහත සඳහන් අභිලාශයන් සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය සැලසුම් හා ක්‍රමෝපායන් දැනටමත් සකස් කොට ඇත.

- වෙරළාසන්න මත්ස්‍ය ගහනය සහ කළපු පද්ධතිවල සමතුලිතතාව නිරන්තර අධීක්ෂණයට භාජනය කරමින් හීනවූ මත්ස්‍ය ගහනය ගොඩනැංවීමේ සහ කළපු පද්ධතිවල පාරිසරික තත්ත්වය ඉහළ නැංවීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කෙරේ.
- ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය ඉහළ නැංවීම සඳහා මහා පරිමාණ සහ බහුදින ධීවර යාත්‍රා නැවැත්වීමට හැකිවන ආකාරයට දැනට පවතින සියලු ධීවර වරාය නවීකරණය කරන අතර අවශ්‍යතා අනුව අලුතින් ඉදිකිරීමට පියවර ගනු ලැබේ.
- ඔළුවිල් වරාය මහා පරිමාණ ධීවර යාත්‍රා මෙහෙයවිය හැකි සියලු පහසුකම් සහිත ප්‍රධාන ධීවර වරායන් බවට පත් කෙරේ.
- බහුදින ධීවර යාත්‍රා සඳහා මුහුදු ජලය භාවිත කරන ශීතකරණ ක්‍රම ප්‍රවර්ධනය සහ සඳහා සූර්ය බලය භාවිතය දිරි ගැන්වීම සඳහා අවශ්‍ය ක්‍රමෝපාය සකස් කෙරේ.
- අන්තර්ජාතික මුහුදු ප්‍රදේශයේ මසුන් ඇල්ලීම සඳහා දේශීය සමාගම් යොමුවීම ප්‍රවර්ධනය සඳහා මසුන් ගැවසෙන කලාප හඳුනාගැනිමට අවශ්‍ය නූතන තාක්ෂණය සහ නවීන මෙහෙයුම් ක්‍රමවේද සහිත වැඩි දියුණු කළ බහුදින ධීවර යාත්‍රා පෙළක් හඳුන්වා දෙනු ලැබේ.
- විශාල ප්‍රමාණයේ බහුදින ධීවර යාත්‍රා ඉදිකිරීම සහ නඩත්තු කිරීම ත්‍රිකුණාමලය වරාය ආශ්‍රිත කලාපයක් ඉදිකිරීමට කටයුතු කෙරේ.
- ලංකාවේ සියලු ධීවර වරායන්, ජැටි සහ මාළු ගොඩබෑමේ ස්ථාන නූතන සන්නිවේදන පහසුකම්, ඉන්ධන සැපයීම් සහ සනීපාරක්ෂක පහසුකම් ආදියෙන් සමන්විත මධ්‍යස්ථාන බවට පත් කෙරේ.
- මත්ස්‍ය අස්වනු ආරක්ෂිතව වෙරළට රැගෙන ඒම, ආරක්ෂිතව ගොඩබෑම, ප්‍රවාහනය සහ කල්තබා ගැනීමේ ක්‍රමවේද දියුණු කිරිම සඳහා පොලී රහිත ණය මුදලක් ධීවර අමාත්‍යාංශය හරහා ලබාදෙනු ලැබේ.
- ජලජීවී නිෂ්පාදන, මුහුදු ආහාර සහ කාබනික මත්ස්‍ය නිෂ්පාදනය, මුහුදු බෙල්ලන්, මුහුදු කූඩැල්ලන් සහ ඉස්සන් වගාව, විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන සහ අභ්‍යන්තර මිරිදිය ධීවර කර්මාන්තය දියුණු කිරීම සඳහා අඩු පොලී ණය බදු සහන සහ රක්ෂණ ආවරණ, තාක්ෂණය, උපදේශනය සහ වෙළඳපොළ සම්බන්ධීකරණ පහසුකම් සලසා දෙනු ලැබේ.
- සැමන් මත්ස්‍ය වගාව දියුණු කිරීම සහ ටින් මාළු කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා පෞද්ගලික සමාගම් සහ ආයෝජකයින් සඳහා අවශ්‍ය ඉඩම්, ආයෝජන සහ තාක්ෂණික පහසුකම් රජයේ මැදිහත්වීමෙන් ලබාදෙනු ලැබේ.

- ධීවර කාන්තාවන් කේන්ද්‍රකර ගත් ධීවර කර්මාන්තය ආශ්‍රිත ගෘහස්ත කර්මාන්ත හඳුන්වාදීමේ වැඩසටහනක් ධීවර නිෂ්පාදන සමූපකාර හරහා ක්‍රියාත්මක කෙරේ.
- උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල අනවසර මසුන් ඇල්ලීම නැවැත්වීම සඳහා ශ්‍රී ලංකාවේ නාවික හමුදාව සහ වෙරළ ආරක්ෂක බළකාය ශක්තිමත් කරන අතර ඉන්දියානු රජය සමඟ ඒකාබද්ධව නව බේරුම්කාර වැඩසටහනක් ඉතා ඉක්මනින් ක්‍රියාත්මක කෙරේ.
- කරදිය සහ මිරිදිය මත්ස්‍ය අභිජනනය වාණිජ මට්ටමින් ව්‍යාප්ත කිරීම සඳහා ධීවර ප්‍රජා සමිති සහ ධීවර හා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ඒකාබද්ධව පුළුල් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කෙරේ.
- ධීවර ප්‍රජාව සඳහා වඩාත් ඵලදායී රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමට කටයුතු කෙරේ.
- ධීවර තරුණයන් ව්‍යවසායකයන් බවට පත්කිරීම සඳහා ඔවුනට නූතන තාක්ෂණික ක්‍රමවේද භාවිතය සහ ධීවර කර්මාන්තය පිළිබඳ උසස් වෘත්තීය සහ අධ්‍යාපනික දැණුම ලබාදීමේ වැඩසටහනක් සාගර විශ්වවිද්‍යාලය ආශ්‍රිතව ක්‍රියාත්මක කෙරේ.
- නිෂ්පාදකයාට සහ පාරිභෝගිකයාට ද සාධාරණය ඉටුවන ආකාරයට මත්ස්‍ය අස්වනු මිලට ගැනීම සහ අලෙවිය සඳහා පුළුල් ආකාරයට ධීවර සංස්ථාව සහ ධීවර ප්‍රජා මූල සංවිධාන යොදා ගනු ලැබේ.

තවද, අතිගරු ජනාධිපති තුමා විසින් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කරන ලද නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුලින් මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන වල අපනයන හැකියාව වර්ධනය කරලීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක අවශ්‍යතාවය හා සාගරය මත පදනම්වූ ආර්ථිකයක් බිහිකරලීමේ අවශ්‍යතාවය අවධාරණය කොට ඇත.

කෙසේවුවත් covid 19 වසංගතයේ අභියෝගයට මුහුණ දීම සඳහා 2020 මැයි මස අමාත්‍යාංශයේ වාර්ෂික සැළැස්ම සංශෝධනය කිරීමට පියවර ගන්නා ලදී.

සමස්ථයක් ලෙස, 2019 වර්ෂය තුල සියලු අභියෝග ජයගනිමින් අපේක්ෂිත ඉලක්ක සාධනය තුලින් සාධනීය ප්‍රතිඵල හා ජයග්‍රහණයන් ලබාගත හැකිවූ අතර, එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමටද, එසේම, ඉදිරි වර්ෂ තුල ගරු ජනාධිපතිතුමන්ගේ ජනතා අභිලාශයන් සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය සැලසුම් හා ව්‍යාපෘති කෙරෙහි විශේෂ අවධානයක් යොමු කොට ඇත.

## 03. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| අයවැය 2019 | | සටහන | තත්‍ය 2019 | 2,018 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 1,747,738,080 | 2,500,429,157 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 222,988,576 | 178,072,096 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 11,568,346 | 10,591,384 | ඒසීඒ-5/5(ඒ)/5(බී) |
| - | වෙනත් ලැබීම් | | 72,344,835 | 54,342,008 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **2,054,639,837** | 2,743,434,645 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **2,054,639,837** | **2,743,434,645** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 91,000,000 | වැටුප්, වේතනසහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 89,417,008 | 104,268,121 | |
| 88,700,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 86,968,938 | 85,492,324 | ඒසීඒ-2(ii) |
| 1,203,000,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 1,238,475,767 | 1,431,066,596 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| 500,000 | වෙනත් පුනරාවර්තනවියදම් | 9 | 36,000 | - | |
| 1,383,200,000 | **මුළු පුනරාවර්තනවියදම් (ඇ)** | | **1,414,897,713** | 1,620,827,041 | |
| | **මූලධන වියදම්** | | | | |
| 16,300,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 9,979,580 | 20,457,994 | |
| 422,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 84,930,869 | 137,847,828 | |
| 600,000,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 417,187,360 | 549,701,035 | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 2,000,000 | හැකියා වර්ධනය | 14 | 1,346,610 | 4,197,586 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3,381,000,000 | වෙනත් මූලධන වියදම් | **15** | 1,894,039,867 | 2,649,760,781 | |
| 4,421,300,000 | **මුළු මූලධන වියදම් (ඉ)** | | **2,407,484,287** | 3,361,965,224 | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **135,798,667** | **196,739,479** | |
| | **තැන්පතු ගෙවීම්** | | 124,755,478 | 184,811,292 | **ඒසීඒ-4** |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 11,043,189 | 11,928,187 | **ඒසීඒ-5/5(ඒ)/5(බී)** |
| | **මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)** | | 3,958,180,668 | 5,179,531,745 | |
| 5,804,500,000 | **2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂයඌ = (ඇ-උ)** | | (1,903,540,831) | (2,436,097,100) | |

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2019 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | තත්‍ය 2,019 රු. | 2,018 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 523,782,990 | 461,540,236 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 26,106,309 | 26,631,466 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **549,889,299** | **488,171,701** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | (252,746,720) | (153,988,466) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 523,782,990 | 461,540,236 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 278,853,029 | 180,619,931 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **549,889,299** | **488,171,701** |

පිටු අංක.........සිට ......... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහසටහන්පිටු අංක .......... සිට .......... දක්වාඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ.මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේපිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හිසටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතාකර ඇත. ඉහත අවසන් ගිණුමෙහිසඳහන්සංඛ්‍යා, ඊටඅදාළ ගිණුම් සටහන් හාඅනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එමසංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| .............................. | .................. | .............................................. |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධානගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : ආර්.එම්.අයි. රත්නායක ලේකම් ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය 02 වන මහළ, නව මහ ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 | තනතුර : | දිනය : 2020 . 06 . 29 |
| දිනය : | දිනය : | K.P.M.S. Perera Chief Financial Officer Ministry of Fisheries and Aquatic Resources New Secretariat Building, Maligawatta, Colombo 10. |

## 3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ජීසීජ්-සී

### 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | තත්‍ය<br>2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | - |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 63,536,644 | 2,527,774,062 |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | - | - |
| අග්‍රිම ලැබීම් | 1,736,038,080 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **1,799,574,724** | 2,527,774,062 |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 207,759,595 | 355,285,375 |
| සහනාධාරසහ මාරුකිරීම් | - | - |
| වෙනත්වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 1,977,784 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | - |
| **මෙහෙයුම්ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **209,737,380** | 355,285,375 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)** | **1,589,837,345** | **2,172,488,687** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | 11,130,180 |
| උපණය අයකර ගැනීම් | - | (8,101,619) |
| අත්තිකාරම් අයකර ගැනීම් | 654,048 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **654,048** | **3,028,561** |

| | | |
|---|---|---|
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 1,644,751,085 | 2,173,320,621 |
| අත්තිකාරම් ගෙවීම් | 6,045,666 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **1,650,796,751** | 2,173,320,621 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | **(1,650,142,703)** | **(2,170,292,060)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඈ) + (ඊ)** | **(60,305,359)** | **2,196,627** |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 148,165,930 | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **148,165,930** | **-** |
| <u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 87,860,572 | 2,196,627 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **87,860,572** | 2,196,627 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **60,305,359** | **2,196,627** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | **(0)** | **0** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **(0)** | **0** |

## 3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

<u>වාර්තා කිරීමේ පදනම</u>

**1) වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ජේය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**2) ගිණුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩි දියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩි දියුණු කළ මුලු පනම මත සිදුකරයි.

**3) ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනීය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.
දේපල, පිරියත හා උපකරණ පිරිවැය ට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

**5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

**6) මුදල් හා මුදල් සමාන දෑ**

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

### 3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුදල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| | අදාල නොවේ | | | | |

### 3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. 000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 1,415,800 | 1,432,800 | 1,414,898 | 98.75% |
| ප්‍රාග්ධන | 4,421,300 | 4,700,600 | 2,390,723 | 50.86% |

### 3.7. මුරෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. 000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| | අදාල නොවේ | | | | | |

## 3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. 000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | 63,767 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | | 334,389 | | |
| 9153 | ඉඩම් | | 3,336 | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | - | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | - | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | 122,089 | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | - | | |

## 3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

උක්ත වාර්තාව ලබා ගැනීම සඳහා 2019 වර්ෂයේ ධීවර අංශයේ කාර්ය සාධන වාර්තාව රජයේ විගණන දෙපාර්තමේන්තුව වෙත 2020.05.12 දින ඉදිරිපත් කරන ලදී.

එසේ වුවද, විගණන පරීක්ෂාව තවදුරටත් සිදුවන බැවින් 2019 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ මතය සකස් කරමින් පවතින බව සඳහන් කරමි.

## 04. කාර්ය සාධන දර්ශක

## 4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% | |
| 2019 වර්ෂයේදී සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 652,390 කින් වැඩිකිරීම | | √ | | $\frac{505,830}{652,390}$ X 100 = 77.5 |
| එක් දිනක් තුළ ග්‍රෑම් 48 කින් ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීම | √ | | | $\frac{46}{48}$ X 100= 95.8 |

**05. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**

**5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු .**

| ඉලක්ක / අරමුණු | ඉලක්ක (2019) | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50%- 74% | 75%- 100% | |
| තිරසාර සංවර්ධන ඉලක්කය 14 | සමුද්‍ර මත්ස්‍ය නිෂ්පාදනය මෙ. ටො 552,390කි | මෙ.ටො 415,490 | | | √ | 415,490 / 552,390 X 100 = 75.21 |
| | දේශීය ජලජීවී වගා මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො 100,000කි | මෙ.ටො 90,340 | | | √ | 90,340 / 100,000 X 100 = 90.34 |
| | ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 48 දක්වා වැඩිකිරීම | දිනකට ග්‍රෑම් 46 | | | √ | 46 / 48 X 100 = 95.83 |

**5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග.**

5.2.1 හැඳින්වීම

නීල තිරසාර සංවර්ධන ඉලක්ක 10කින් සමන්විත වන අතර ඉන් 06 ක් සෘජුව ධීවර කර්මාන්තය හා සම්බන්ධව වේ.

1. සාගර සහ වෙරළාසන්න පරිසර පද්ධති තිරසාර ලෙස කළමණාකරනය සහ ආරක්ෂා කිරීම.
2. නීති විරෝධී, වාර්තා නොවන හෝ නියාමනය නොවන ධීවර කර්මාන්තය වැළැක්වීම (IUU Fishing)
3. වෙරළාසන්න සහ සමුද්‍රිය ප්‍රදේශයන්ගෙන් අවම ලෙස 10% ක ප්‍රමාණයක් සංරක්ෂණය
4. ප්‍රශස්ත අගය ඉක්මවා මසුන් ඇල්ලීමට දායක වන (Over fishing) සහනාධාර තහනම් කිරීම.
5. තිරසාර ධීවර කර්මාන්තය, ජලජීවී වගාව සහ සංචාරක කර්මාන්තය තුළින් සංවර්ධනය වෙමින් පවතින කුඩා දූපත් රාජ්‍ය වලට සහ අවම වශයෙන් සංවර්ධිත රටවලට ආර්ථික ප්‍රතිලාභ වැඩි කිරීම.
6. විද්‍යාත්මක දැණුම වැඩිදියුණු කිරීම, පර්යේෂණ ධාරිතාවය ඉහළ නැංවීම සහ තාක්ෂණය හුවමාරු කර ගැනිම.

වෙරළබඩ ජාතීන් හට ඉහත ඉලක්කයන් නව අවස්ථා හා අභියෝගයන් නිර්මාණය කරයි.

### 5.2.2 අවස්ථා

1. ඉන්දියන් සාගර ටූනා කොමිසම (IOTC) වැනි ජාත්‍යන්තර සම්මුති ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම.
2. වගකීමක් සහිත ධීවර කර්මාන්තයක් ශක්තිමත් කිරීම වෙනුවෙන් නොර්වේජියානු රජය, ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය, ලෝක පරිසරය සංරක්ෂණය සඳහා වූ අන්තර්ජාතික සංගමය (IUCN), එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන වැනි විදේශීය ආධාර සපයන නියෝජිතායතනයන්ගේ ඉදිරිපත් වීම හා දක්වන සහයෝගය.
3. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබූ ධීවර හා ජලජීවී වගා ප්‍රතිපත්තිය.

   මෙම නව ප්‍රතිපත්තියෙහි අරමුණු වන්නේ,

- සම්පත් වල තිරසාර බව සහතික කිරීම සහ සම්පත් භාවිත කරන්නන් අතර ප්‍රතිලාභ සමාන ආකාරයෙන් බෙදී යාම සහතික කිරීම.
- ධීවර හා ජලජීවී වගාවේ තිරසාර සංවර්ධනය වෙනුවෙන් තීරණ ගැනීමේදී සහභාගිත්ව ප්‍රවේශයන් ශක්තිමත් කිරීම.
- පවත්නා රෙගුලාසි සමාලෝචනය කිරීම මඟින් ප්‍රධාන සැලසුම සකස් කිරීම සඳහා අවස්ථාවක් සැපයීම.
- ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජීවී වගා කර්මාන්තය දැණුම පදනම් කරගත් නවීන තිරසාර කර්මාන්තයක් බවට පරිවර්තනය කිරීම.
- නාරා (NARA) ආයතනය සමග එක්ව නොර්වේජියානු පර්යේෂණ ආයතනය (සමුද්‍ර පර්යේෂණ ආයතනය) ඉන්දියන් සාගරයෙහි ක්‍රියාත්මක කර ඇති පර්යේෂණ ව්‍යාපෘතිය. (උදා: නොර්වේජියානු RV Fridjjot Nansen පර්යේෂණ නෞකාව මගින් සම්පත් පිළිබඳ සමීක්ෂණයක් පවත්වා ඇත.)

4. ධීවර සම්පත් ප්‍රශස්ත අන්දමින් භාවිතා කිරීමේ ක්‍රමෝපාය.
5. ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සහ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමේ හැකියාව.
6. ධීවර ප්‍රජාවන් අතර මසුන් ඇල්ලීම පිළිබඳ ගැටුම් අවම කිරීම.
7. වෙරළබඩ ජාතීන් අතර මසුන් ඇල්ලීම පිළිබඳ ගැටුම් අවම කිරීම.

### 5.2.3 අත්කරගත් ජයග්‍රහණ

**1. පශ්චාත් අස්වනු හානිය අවමකිරීම සඳහාවූ ක්‍රියාමාර්ග :**

I. පශ්චාත් අස්වනු හානිය අවම කර ගැනිමට අවශ්‍ය තාක්ෂණ භාවිතය සඳහා පුහුණුවීම් හා දැණුවත් භාවය ඇතිකරලීම

II. ගැඹුරු මුහුදේ මත්ස්‍ය අස්වැන්න නෙලා ගැනීම හා මත්ස්‍ය සම්පත් වල අගය වැඩි දියුණු කිරීම තුලින් පසු අස්වනු හානිය අවම කරලීම හා ඒ තුළින් දළ දේශීය නිෂ්පාදනය සඳහා වන දායකත්වයේ වර්ධනයක් ඇති කිරීම.

III. දේශීය හා විදේශීය ආයෝජකයින්ට මත්ස්‍ය ආශ්‍රිත සම්පත් ගුවන් මගින් අපනයනයට පහසුකම් සැලසීම.

IV. ධීවර වරාය යටිතල පහසුකම් සංවර්ධනය.

**2. නීති විරෝධීව මත්ස්‍ය අස්වැන්න නෙලා ගැනීම වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග :**

I. නීතිවිරෝධී ආම්පන්න භාවිතය හා ආනයනය තහනම් කිරීම.
II. පරිසරය විනාශ නොවන පරිදි මත්ස්‍ය අස්වනු නෙලා ගැනීමට අවශ්‍ය ආම්පන්න භාවිතා කරන ධීවර ජනතාව ධෛර්යමත් කරළීම සඳහා දිරිගැන්වීම් ක්‍රම යොදා ගැනීම.
III. කලපු මත්ස්‍ය අස්වැන්න නෙලාගැනීම සඳහා සාම්ප්‍රදායක යාත්‍රා භාවිතය වර්ධනය කිරීම.
IV. සහභාගිත්ව කළමනාකරණ ක්‍රමවේද යොදාගැනීම.

**3. ධීවර ප්‍රජාවේ ආදායම් වර්ධනය කිරීමට ක්‍රියාමාර්ග :**

I. සාම්ප්‍රදායික ධීවර යාත්‍රා භාවිතා කරන ධීවර ප්‍රජාවට විකල්ප රැකියා අවස්ථා වැඩිකිරීම
II. පරිසරය ආශ්‍රිත සංචාරක ව්‍යාපාරය වැඩිදියුණු කිරීමට සාම්ප්‍රදායික ධීවර යාත්‍රා යොදාගැනීම

### 5.2.4. අභියෝග

1. කාර්මීකරණය සීඝ්‍රයෙන් ඉහල යන රටක් ලෙස පරිසර දූෂණය සීඝ්‍රයෙන් ඉහල යාම.
2. මත්ස්‍ය හා ධිවර නිෂ්පාදන සඳහා ජාතික හා ජාත්‍යන්තර ඉල්ලුම ඉහල යාම.
3. නීතිවිරෝධී, වාර්තා නොවන හා නියාමන නොවන හා හානිදායක පරිදි මත්ස්‍ය අස්වැන්න නෙලාගැනිමට දරන උත්සාහය ඉහලයාම.(IUU Fishing)
4. පසු අස්වනු හානිය අවම කිරීමට ගන්නා ක්‍රියාමාර්ග නිසියාකාරව සිදු නොවීම මත ධීවර හා මත්ස්‍ය නිෂ්පාදන වල ගුණාත්මක තත්ත්වය පහළ වැටිම.
5. මත්ස්‍ය අස්වනු නෙලීම සහ පසු අස්වනු හානිය අඩුකිරීම පිළිබඳ ආකල්ප සංවර්ධනය නොවීම.
6. පසු අස්වනු හානිය අවම කිරීම සඳහා තාක්ෂණික භාවිතය දුර්වල වීම.
7. ධිවර කර්මාන්තයේ තිරසාර බව සහ ධිවර ප්‍රජාවන්ගේ ජීවනෝපාය සහතික කිරිම
8. පරිසර පද්ධති පදනම් කරගත් ධිවර කළමනාකරණය ක්‍රියාවට නැංවීම.
9. මුහුදු ජල මට්ටම ඉහළ යාම
10. ධීවර ජනතාවගේ ධීවර කටයුතු වල අඛණ්ඩ තිරසර භාවය පිළිබඳ අවිනිශ්චිතතාව
11. ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය පිළිබඳ අවිනිශ්චිතභාවය.
12. ධීවර කර්මාන්තය නැවත ප්‍රතිෂ්ඨාපනයෙහි දුර්වලතා.
13. කළමනාකරණය සහ මත්ස්‍ය වෙළඳාම සඳහා වන අන්තර්ජාතික අවශ්‍යතා සපුරා ගැනීමේ ගැටළු.
14. පවත්නා නීති ක්‍රියාත්මක කිරීමේ ගැටලු.
15. වෙරළබඩ සම්පත් කළමනාකරණ දුර්වලතා.
16. සම්පත් අධික ලෙස උකහා ගැනීම සහ විනාශවීම.
17. සාගර පරිසර පද්ධති පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවයේ අඩුපාඩුකම්.
18. ධීවර අංශය තුල නව පර්යේෂණ සඳහා තාක්ෂණික සහ මූල්‍යමය බාධක.
19. ඉන්දියානු ධීවරයින් ශ්‍රී ලංකා මුහුදු සිමාව උල්ලංඝණය කොට මත්ස්‍ය සම්පත් නෙලාගැනිම හා ඉන් සිදුවන පාරිසරික හානි.

## 06.මානව සම්පත් පැතිකඩ

### 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/(අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 24 | 17 | 07 |
| තෘතීයික | 05 | 04 | 01 |
| ද්විතියික | 115 | 85 | 30 |
| ප්‍රාථමික | 57 | 51 | 06 |

### 6.2. **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය.

පවත්නා පුරප්පාඩු නොතකා, වර්තමාන කාර්ය මණ්ඩලයට කාර්යක්ෂමව රාජකාරි ඉටුකිරීමට හැකිවී තිබේ.

එසේම, සේවාව තවුරටත් වැඩිදියුණු කිරීම සඳහා පුරප්පාඩු පුරවාලීමට අදාළ බලධාරීන්ට ඉල්ලීම් කර ඇත.

## 6.3. මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු. '000) | | වැඩසටහනෙ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| අලුතින් පත් කරන ලද අය සඳහා පුහුණු කිරීම් (කා.කා.ස) | 20 | 2019.06.04 - 2019.06.07 | 23,180 | - | දේශීය | පුහුණු විෂය ක්ෂේත්‍ර වල සමස්ථ ඵලදායිතාව ය ඉහළ නංවා ඇත |
| | | | | | | |
| දේශන දෙමළ භාෂා සහාය (භාෂා කුසලතා යටතේ) | - | 2019.01.08 සිට මේ දක්වා | පැයකට . 1,500 (සතියකට දින 2ක් සඳහා) | - | දේශීය | |
| සමාජ සංඛ්‍යාලේඛන පිළිබඳ පශ්චාත් උපාධි උපාධිය | 1 | වර්ෂයක් | 66,000 | - | දේශීය | |
| විදේශීය පුහුණුව සඳහා නිවාඩු සහ දීමනා ලබා ගැනීමේ ක්‍රම | 1 | දිනක් | 5,000 | - | දේශීය | |
| වෘත්තීය ඉංග්‍රීසි ඩිප්ලෝමාව (i) | 1 | සතියක් | 25,000 | - | දේශීය | |
| වෘත්තීය ඉංග්‍රීසි ඩිප්ලෝමාව (ii) | 2 | සතියක් | 50,000 | - | දේශීය | |
| වෘත්තීය ඉංග්‍රීසි ඩිප්ලෝමාව(11 1) | 1 | සතියක් | 25,000 | - | දේශීය | |
| පරිගණක පුහුණුව | 50 | සතියක් | (13.000 * 50) රු.750,000 | - | දේශීය | |

## 07.අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේදි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **01** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නැත | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නැත | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නැත | | |
| 1.6 | වෙනත් | අදාල නැත | | |
| **02** | **පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම ( මූ.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2,2 | පුද්ගල පඩිනඩි ලේඛණ/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2,3 | විගණන විමසුම් ලේඛණය යාවත් කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත් කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **03** | **මුල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරිම ( මු.රෙ 135)** | | | |
| 3.1 | ආයතනය තුළ මුල්‍ය බලතල පවරා තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මුල්‍ය බලතල පවරා තිබීම පිළිබඳව ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **04** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **05** | **විගණන විමසුම** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **06** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. (134) (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **07** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA/1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| **08** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොන්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම.සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොන්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | කොරෝනා වසංගතය නිසා කාර්යාලය වසා තැබීම | කාර්යාල ආරම්භ කිරීමෙන් පසු සිදුකල හැක. |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල නොවේ | කොරෝනා වසංගතය නිසා කාර්යාලය වසා තැබීම | කාර්යාල ආරම්භ කිරීමෙන් පසු සිදුකල හැක. |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදුකිරීම | අනුකූල නොවේ | කොරෝනා වසංගතය නිසා කාර්යාලය වසා තැබීම | කාර්යාල ආරම්භ කිරීමෙන් පසු සිදුකල හැක. |
| **09** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එලඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | වසර 25 කට වඩා පැරණි බැවින් පරිපාලන ක්‍රියාමාර්ග තුලින් අයකර ගැනීම දුෂ්කර වීම | රා.මු.ච.369 තුලින් අදාල ක්‍රමවේදයට අනුව ණය ශේෂ කපාහැරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම සිදු කොට තිබීම | අදාල නැත | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිනුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අදාල නැත | | |

| | | | | |
|---|---|---|---|---|
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාල නැත | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූලනොවේ | මානව සම්පත් සැලැස්ම පිළියෙල කරමින් පවතියි | මානව සම්පත් සැලැස්ම සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ (19.1 හි සඳහන්) 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩදටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |